# අගතිගාමී අදහස් පිළිබඳ මාර්ගෝපදේශ සහ යුක්තිය සඳහා ප්‍රවේශය

## යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වූවන්ගේ අපකීර්තිය ආමන්ත්‍රණය කිරීම

British High Commission Colombo

Centre for Equality and Justice

# අගතිගාමී අදහස් පිළිබඳ මාර්ගෝපදේශ සහ යුක්තිය සඳහා ප්‍රවේශය

## යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වූවන්ගේ අපකීර්තිය ආමන්ත්‍රණය කිරීම

© සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (Centre for Equality and Justice)

සියළුම හිමිකම් ඇවිරිණි.

2018 ජුලි මස මුද්‍රණය කර ප්‍රකාශයට පත්කරන ලදී.
සහයෝගීතා අනුග්‍රහය: බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය, කොළඹ

මෙම ග්‍රන්ථයෙහි ප්‍රකාශකර ඇති අදහස් සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූවන්ගේ අදහස් වන අතර, ඒවා අවශ්‍ය වශයෙන් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය, ශ්‍රී ලංකා හි අදහස් සහ ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි. මෙම ප්‍රකාශනයෙහි කිසිදු කොටසක් පූර්ණ පිළිගැනීමකින් තොරව ප්‍රතිනිෂ්පාදනය කිරීම, සමුද්ධරණ පද්ධතියක ගබඩා කිරීම හෝ ඕනෑම ආකාරයකින් හෝ ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායාපිටපත් කිරීම, පටිගත කිරීම හෝ අන් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම නොකළ යුතුය.

වැඩිදුර තොරතුරු සඳහා අමතන්න:
සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (Centre for Equality and Justice)
325 ඒ 1, තිඹිරිගස්යාය, කොළඹ 05
දුරකථන/ෆැක්ස්: +94 11 2055404, +94 11 2501457

# 1. හැඳින්වීම

යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය (CRSV) හා මුසු වූ අපකීර්තිය යන්න පරම්පරා ගණනාවක් පුරා පවතින්නාවූ ප්‍රභල බලපෑම් ඇති අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් කරවන චක්‍රයේ කොටසකි. CRSV යනු කැමැත්තෙන් තොරව සිදු කරන ලද ලිංගික ස්වභාවයේ ඕනෑම ක්‍රියාවක් හෝ පුද්ගලයෙකුගේ ලිංගික ක්‍රියාකාරිත්වය හෝ ලිංගික අවයව විශේෂයෙන් ඉලක්ක කරන්නා වූ යුධ ගැටුමකට සෘජුව හෝ වක්‍රව සම්බන්ධතාවයක් ඇති ඕනෑම ක්‍රියාවකි. මෙම සම්බන්ධතාවය, අපරාධකරුගේ විස්තරය තුළින් (බොහෝවිට ත්‍රස්ත සංවිධානයක් හෝ ජාලයක් ඇතුළුව රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායමක් සමඟ බැඳී සිටින) වින්දිතයාගේ විස්තරය තුළින් (නිරන්තරයෙන්ම පීඩිත දේශපාලනික,වාර්ගික හෝ ආගමික සුළුතරයේ සත්‍ය හෝ එසේ යැයි හඳුනාගත හැකි සාමාජිකයෙකු වන්නෙකු හෝ සත්‍ය හෝ එසේ යැයි හඳුනාගත හැකි ලිංගික හැඩගැස්ම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය මත ඉලක්ක කරනු ලබන්නෙකු), දඬුවම් නොලැබීමේ වාතාවරණය (රාජ්‍යයන් බිඳවැටීම සමඟ සාමාන්‍යයෙන් බැඳී ඇති), දේශසීමා ප්‍රතිවිපාක (අවතැන්වීම හෝ මිනිස් ජාවාරම වැනි) සහ/හෝ සටන් විරාම ගිවිසුමක විධිවිධාන උල්ලංඝනය කිරීම මගින් පිළිඹිබු විය හැකිය[1]. මේ ආකාරයේ පුළුල් අර්ථ දැක්වීමක් තුළින් වින්දිතයින් වශයෙන් ඉතිරිව සිටින්නන්ගේ විවිධ වූ අත්දැකීම් හඳුනාගැනීමට ඉඩකඩක් නිර්මාණය කර ඇත.

බොහෝවිට, යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් කාන්තා වින්දිතයින් විසින් අත්දකින ලද අපකීර්තිය ස්ත්‍රීපුරුෂභාවය මත පදනම් වූ අසමානතා වල, වෙනස්කොට සැලකීමේ පරිචයන් වල සහ ගැටුම් වලට පෙර සිට පවතින පූර්වාකල්පිත න්‍යායමයන්හි දිගුවකි. මෙහි සෘජු ප්‍රතිඵලයක් ලෙස, අගතිගාමී අදහස් CRSVහි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් තැනැත්තන් අවම හෝ කිසිදු පිහිටක් නොමැතිව අත්හැර දමමින් එකිනෙකාගේ ස්වංක්‍රීය වරණයට මඟපාදයි.

අගතිගාමී අදහස් පිළිබඳ මාර්ගෝපදේශ, යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට සමාන මට්ටමේ ඉඩකඩක් නිර්මාණය කිරීමේ සහ ප්‍රතිපත්ති සම්පාදකයින්, වෘත්තිකයින් හා අනෙකුත් පාර්ශවකරුවන් විසින් ඔවුන්ට යුක්තිය ඉටු වීම ප්‍රතික්ෂේප නොවේ හෝ ප්‍රමාද නොවේ ය යන්න සහතික කිරීමට හෘදය සාක්ෂියට අනුකූලව පියවර ගනු ලබන පරිසරයක් වර්ධනය කිරීමේ වැදගත්කම හඳුනාගනියි.

මෙම සංක්ෂිප්ත සටහන කොටස 4 කට බෙදා තිබේ.

1. CRSV සමඟ බැඳුණු අපකීර්තියේ ප්‍රතිඵලයක් ලෙස පවතින අගතිගාමී අදහස් වලට හේතු හා ඒවායේ ප්‍රතිඵල පිළිබඳ විශ්ලේෂණයක්.
2. CRSV පිළිබඳ අන්තර්ජාතිකහ හා දේශීය නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුවේ ස්වභාවය.
3. CEDAW සාමාන්‍ය නිර්දේශ අංක 30 සහ අංක 33 හි විෂයපථය.
4. CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය හා බැඳුණු අගතිගාමී අදහස් ආමන්ත්‍රණය කිරිම පිණිස පාර්ශවකරුවන්ව මෙහෙයවීම සඳහා පවතින්නාවූ දිවිගලවාගත් වින්දිතයින් කේන්ද්‍ර කරගත්, ස්ත්‍රීපුරුෂභාවය සමඟ සංවේදී අගතිගාමී අදහස් සම්බන්ධ නිර්දේශයන් සහ මාර්ගෝපදේශ.

1 එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ වාර්තාව S/2015/203;
ගැටුම් සම්බන්ධ ලිංගික ප්‍රචන්ඩත්වය පිළිබඳ මහලේකම් වාර්තාව S/2017/249

# 2. අගතිගාමී අදහස් වල ස්වභාවයන් සහ එහි ප්‍රකාශනයන්

## 2.1 අගතිගාමී අදහස් ඇති කරන හා පවත්වාගෙන යාමට හේතු වන සාධක

විවිධාකාරයේ සමාජ සම්මතයන් සමඟ අනුගතවීම කාන්තාවන්ගෙන් සාමාන්‍යයෙන් බලාපොරොත්තු වන හෙයින් CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් කාන්තාවන් අපකීර්තියට පත් කිරීමේ මූලික හේතූන් ශ්‍රී ලාංකික සමාජයේ හදවත තුලින් සොයාගත හැකිය. පීතෘමූලිකත්වය විසින් කාන්තාවන් යනු ඇය හා සම්බන්ධිතව ඇති ගෞරවය හා කීර්තිය ආරක්ෂා කිරීම පිණිස ඇයගේ නිර්මලත්වය ආරක්ෂා කල යුතු පහසුවෙන් පීඩාවට පත්විය හැකි පුද්ගල කොට්ඨාශයක් ලෙස මුද්‍රා තබයි. කාන්තාවක් කෙරෙහි එල්ල කරන ලද ඕනෑම ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවක් ඇයගේ චරිතය කෙලෙසන්නක්, වරද හා එහි ලැජ්ජාව අපරාධකරුගෙන් වින්දිතයා වෙතට මාරුකරවන්නක්, සමාජ කැළැලක් ඉතිරිකරවන්නක් ලෙස බොහෝවිට අවබෝධ කරගනු ලබයි. ගැටුමකට පූර්වයෙන් පවතින මෙකී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ කාවැද්දීම් එකී ගැටුම අතරතුර හෝ ඉන් පසුව ඒවායේ ආවේණික සංකීර්ණතාවයන් හා උග්‍ර බල අසමතුලිතතාවයන් නිසා වඩාත් උත්සන්න කරවන තත්වයට පත්වේ.

මීට අමතරව, ජනවාර්ගික/ජාති, ආදිවාසි හෝ සුළුතර තත්වයන්, සමාජ ආර්ථික තත්වය සහ/හෝ කුලය, භාෂාව, ආගම හෝ විශ්වාසය, දේශපාලන මතය, විවාහ සහ/හෝ මාතෘ තත්වය, වයස, නාගරික/ග්‍රාමීය පිහිටීම, සෞඛ්‍ය තත්වය, ආබාධිතභාවය, සහ දේපළ හිමිකම යනාදිය කාන්තාවන්ට එරෙහි වෙනස්කම් සංකීර්ණ කිරීමට හේතුවන අතරම යුක්තිය සඳහා ප්‍රවේශය ඔවුන්ට වඩාත් දුෂ්කර කරවයි.

CRSV හි වින්දිතයෙකු ඕනෑම අයෙකු විය හැකිය. ඇය එල්.ටී.ටී.ඊ. හිටපු සටන්කරුවෙකු විය හැකිය. ඇයගේ ප්‍රජාව තුළ අයහපත් කාන්තාවක් ලෙස සලකනු ලද සිංහල යුධ වැන්දඹුවක්; රජයේ සන්නද්ධ හමුදා වල හෝ එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකු/යින් විසින් සිදු කරන ලද ලිංගික හිංසනයක වින්දිතයෙකු; යුද්ධය පිළිබඳව වාර්තා කරන මාධ්‍යවේදියෙකු; සිය පවුලට ජීවත්වීම සඳහා අවශ්‍ය කරන දෑ සැපයීමට උත්සහ කරන කාන්තා ගෘහ මූලිකයෙකු හෝ ආබාධිත කාන්තාවක් විය හැකිය. එකී සෑම නිදසුනක් සමඟම, සලකා බලන ලද වැදගත් සාධක කාන්තාවකගේ අත්දැකීම් වෙනස් හා වඩාත් සංකීර්ණභාවයට පමුණුවන අතර අපකීර්තියට පත් කිරීමට සලස්වන සහ ඇයගේ ප්‍රජාව තුළ හා ඉන් පිටත අගතිගාමී අදහස් වලට ලක් කරවයි.

## 2.2 අගතිගාමී අදහස් වල ප්‍රතිඵල

ස්ත්‍රී පුරුෂ අසමානතාවයන් ඇති කරන අපකීර්තිය හා අගතිගාමී අදහස් CRSV හි වින්දිතයකු බවට පත්ව දිවිගලවාගත් කාන්තාවකට අසමාන ලෙස සැලකීමට හේතුව බවට පත්වේ. ඇයට අධ්‍යාපනය හා ජීවනෝපායන් සඳහා ඇති අවස්ථා වලට සමාන ඉඩපහසුකම් ලබාදීම; අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් වන්දි හා තොරතුරු ලබා ගැනීම; යුද්ධයෙන් පීඩාවට පත්වූ කාන්තාවක් ලෙස ඇය හිමිකම් දරන රාජ්‍ය ප්‍රතිලාභ හා සේවාවන් වලට; සහ නිරුපද්‍රිත හා සුරක්ෂිත ජීවන තත්වයන්ට ඇති ඉඩ ප්‍රතික්ෂේප කෙරේ.

CRSV සමඟ බැඳී ඇති අපකීර්තියේ ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අගතිගාමී අදහස් විවධ අකාරයන්ගෙන් එහි ප්‍රායෝගික භාවිතයට පරිවර්තනය වන බව ප්‍රත්‍යක්ෂ වේ. මධ්‍යස්ථ, අපක්ෂපාතී හා ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී විමර්ශයන් සිදු කිරීමට අපොහොසත් වීම; පරිවර්තකයින් හා ප්‍රමාණවත් වෛද්‍ය හෝ මනෝසමාජීය සහය සැපයීමට අසමත් වීම; සැකකරුවන්ව ප්‍රශ්න කිරීමට සහ සිදු කළ අපරාධ වලට වරදකරුවන් කිරීමට අසමත් වීම; සිදුවීම් වාර්තා කිරීම සම්බන්ධයෙන් වින්දිතයින්ට දඬුවම් පැමිණවීම; කිනම් වැරදි අනෙකුත් ඒවාට වඩා බරපතල වැරදි වන්නේද යන්න සම්බන්ධයෙන් ධුරාවලියක් ඇති කිරීම තුළින් ගොනු කරන පැමිණිලි සුළු කොටතැකීම; අධිකරණයන් තුළ සහ මාධ්‍යයන් ඉදිරියේ කාන්තාවන් නැවත අපකීර්තියට පත් කරීම එම අවස්ථා වලින් කිහිපයක් පමණි.

එකී සෑම අවස්ථාවකදීම, CRSV හි වින්දිතයකු බවට පත්ව දිවිගලවාගත් කාන්තාවකට සමාජය තුළ සමානයෙකු ලෙස සහභාගීවීමට ඇයට ඇති හැකියාවට සහ ඇයගේ සිවිල්. දේශපාලනික, ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාවට බලපෑම් ඇති කරන ලෙස යුක්තියට ප්‍රවේශ වීමට ඇති ඉඩ ප්‍රතික්ෂේප කෙරේ.

> "බිය හේතුවෙන් මා කිසිදිනක ප්‍රතිකර්මයක් බලාපොරොත්තු නොවුණි. සිදු වූ දෑ සම්බන්ධයෙන් යුක්තිය උදා වීමකට කිසිදු ඉඩකඩක් එහි නොවීය. යුද හමුදාවට විශාල බලයක් සහ පාලනයක් තිබේ. කිසිවෙකුත් ඔවුන්ට අභියෝග නොකරයි. එහෙයින් මා නිරන්තරයෙන් ජීවත්වන්නේ බියකිනි."
>
> **වින්දිතයෙකු බවට පත්ව දිවිගලවාගත් මඩකලපුවේ දමිළ වැසියෙක්**

# 3. නෛතික හා ප්‍රතිපත්තිමය රාමුව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව දක්වනුයේ, සියලු පුද්ගලයින් නීතිය ඉදිරියේ සමාන වන බවත් නීතියේ සමාන රැකවරණයට හිමිකම් දරන බවත් කිසිදු පුරවැසියෙකුට වෙනස්කොට සැලකීම තහනම් කරන ලද අනෙකුත් පදනම් අතර ස්ත්‍රීපුරුෂභාවය මත පදනම්ව වෙනස්කොට සැලකීම සිදු නොකල යුතු බවයි. ප්‍රායෝගිකත්වය තුළ, කාන්තාවන් බොහෝවිට ඔවුන්ගේ ජීවිතයේ කිසියම් හෝ අවස්ථාවකදී ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ වෙනස්කමකට හෝ ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරු වේ.

“ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය” යන UNHRC රෙගුලාසි අංක 30/1 දරන යෝජනාව, 2015 දී, සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන්හිදී ලිංගික හා ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම සඳහා රජයේ කැපවීම පිළිගනී. ඉතා වැදගත් ලෙස, අධිකරණමය හා නඩු පැවරීමේ ආයතනද ඇතුළුව විශ්වසනීය යුක්ති ක්‍රියාදාමයක් සහ අතීත අනිසි භාවිතාවන් හා උල්ලංඝනය කිරීම් යථාවත් කිරීමට ස්ථාපිත කර ඇති යාන්ත්‍රණයන් ස්වාධීන, අපක්ෂපාතී හා විනිවිදභාවයෙන් යුතු විය යුතු අතර එය ඉහළම මට්ටමේ වෘත්තිකභාවය. අවංකභාවය සහ අපක්ෂපාතිබව පෙන්වනු ලබන පුද්ගලයින් විසින් මෙහෙයවිය යුත බව එමගින් හඳුනගනියි.

මෙම කැපකිරීම් පවත්වාගෙන යමින්, අදාළ ප්‍රතිපත්තිමය රාමුව සහ ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ආමන්ත්‍රණය කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016 - 2020) රජයේ, සිවිල් සංවිධාන වල, පෞද්ගලික අංශයේ සහ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන වල ක්‍රියාකාරිකයින්, විශේෂඥයින් සහ බහුවිධ පාර්ශවකරුවන් ආකර්ෂණය කරගත් උපදේශන ක්‍රියාවලියක් හරහා 2016 ජූනි මාසයේදී කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදි. මේ තුලින් ලිංගික හා ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමට බහුපාර්ශවීය රාමුවක් සම්පාදනය කෙරෙන අතර යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් සඳහා පවතින වැළැක්වීම, ප්‍රතිචාර දැක්වීම හා ප්‍රතිපත්තිමය උපදේශනය යන පුළුල් ඛාණ්ඩ 03 කට වැටෙන සංක්‍රාන්තික යුක්තිය සම්බන්ධ අධිකරණමය හා අධිකරණමය නොවන යාන්ත්‍රණයන් පිහිටුවනු ලබයි.

2017 ඔක්තෝබර් මාසයේදී රජය විසින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා කාන්තාවන් සවිබල ගැන්වීම ප්‍රමුඛතා අංශ ලෙස හඳුනා ගනිමින් මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2017 - 2021) [NHARP] දියත් කරන ලදි. සමානාත්මතාවය, ඉඩප්‍රස්ථාවන් සඳහා සමාන ප්‍රවේශය සහ යමෙකුගේ ආර්ථික, සිවිල්, සමාජ හා දේශපාලනික අයිතිවාසිකම් භුක්ති විඳීමට හා ක්‍රියාත්මක කිරීමට ඇති නිදහස සහතික කිරීම අපේක්ෂා කරන, ක්‍රියාත්මක කිරීම සඳහා වන යාන්ත්‍රණයන්ද සමඟින් ඇති පුළුල් ඉලක්ක සමූහයට CRSV සමඟ බැඳුණු අපකීර්තිය හා අගතිගාමී අදහස් ආමන්ත්‍රණය කිරීම සම්බන්ධ ඍජු බලපෑමක් ඇති පහත ඉලක්කයන්ද ඇතුළත් වේ.

- කාන්තාවන්ට එරෙහි වෙනස්කම් ඇති කරන ඒකාකෘතීන් තුරන් කිරීම.
- වින්දිතයින්ගේ අයිතිවාසිකම් සහ අපරාධ කරුවන්ගේ වගකීම සහතික කරන ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී යුක්ති ක්‍රමයක් නිර්මාණය කිරීම.
- බහු අංශයන්හි මැදිහත්වීම ඔස්සේ කාන්තාවන්ට හා ගැහැණු දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම.
- කාන්තා ගෘහ මූලිකයින්ද ඇතුළුව යුද්ධයෙන් බලපෑමට ලක්වූ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- අතුරුදහන්වීම් සහ අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් වගවීමක් ඇතිකිරීමට සහ එම පවුල් වල සාමාජිකයින්ට පිළියම් සහ සහන ලබා දීම සඳහා රාජ්‍ය වගකීම සහතික කිරීම.
- කාන්තා ගෘහ මූලිකයින්ද ඇතුළුව යුද්ධයෙන් බලපෑමට ලක්වූ කාන්තාවන්ට එරෙහි ලිංගික අපයෝජනයන් සහ ප්‍රචණ්ඩත්වය මැඩලීම සඳහා පුද්ගලයින් ස්ථානගත කිරීම හා ආයතනික යාන්ත්‍රණය ශක්තිමත් කිරීම.
- සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය තුළ ගැටුම් වලින් පීඩාවට පත්වූ කාන්තාවන්ගේ සහභාගිත්වය සහතික කිරීම.
- හමුදා වැන්දඹුවන්ට රාජ්‍ය සේවාවන් සැපයීම.
- හිටපු කාන්තා සටන්කරුවන් නැවත සමාජගත කිරීම.
- ප්‍රතිපත්තීන් සහ සහයන් මගින් සිය අවශ්‍යතාවයන්ට පිළිතුරු සපයන බව තහවුරු කර ගැනීමට අභ්‍යන්තරික අවතැන්වූවන් (IDPs) සමඟ සාකච්ඡා කිරීමෙන් දික්ගැසුණු අවතැන්වීමේ ගැටලුව ආමන්ත්‍රණය කිරීමට නැවත පැමිණීම, නැවත පදිංචි කිරීම හා යථා තත්වයට පත් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

## 4. CEDAW සාමාන්‍ය නිර්දේශ

> ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ඒකාකෘතිකභාවයන්, අපකීර්තිය, හිංසාකාරී සහ පීතෘමූලික සංස්කෘතික නියාමයන් සහ විශේෂයෙන්ම කාන්තාවන්ට බලපාන ස්ත්‍රී පුරුෂභාවය මත පදනම වූ කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම යනාදිය කාන්තාවන්ට පුරුෂයින් හා සමාන පදනමකින් යුක්තියට ප්‍රවේශ වීමට ඇති හැකියාවට අහිතකර බලපෑමක් ඇති කරවයි.
>
> **සාමාන්‍ය නිර්දේශ අංක 33, 8 වන ඡේදය**

කාන්තාවන්, සාමය හා ආරක්ෂාව යන්න CEDAW රාමුව තුළ හා ආරක්ෂක මණ්ඩල න්‍යාය පත්‍රය තුළ අත්‍යවශ්‍ය අංගයක් ලෙස දිගටම පවතී. යුධ ගැටුම් යන සංදර්භය තුළ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම යන්න, යුධ ගැටුම් වැළැක්වීම, යුධ ගැටුම් හා පශ්චාත් යුධ ගැටුම් වාතාවරණයන් තුළ කාන්තාවන් සම්බන්ධයෙන් වන සාමාන්‍ය නිර්දේශ අංක 30 හි සහ යුක්තිය වෙත කාන්තාවන්ගේ ප්‍රවේශය සම්බන්ධයෙන් වන සාමාන්‍ය නිර්දේශ අංක 33 තුළ CEDAW මගින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබේ.

### 4.1 සාමාන්‍ය නිර්දේශ අංක 30

පොදු නිර්දේශ අංක 30 මගින් යුධ ගැටුම් වල බලපෑම, හා යුධ ගැටුම් වැළැක්වීමේ ප්‍රයත්නයන් තුළින් කාන්තාවන් බැහැර කිරීම, පශ්චාත් යුධ ගැටුම් සංක්‍රාන්තිය හා නැවත ගොඩනැගීමේ ක්‍රියාවලිය පිළිබඳව හඳුනාගන්නා අතර හරයාත්මක ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වැඩිදියුණු කිරීම පිණිස එකඟව ඇති උත්සාහයන් ගැනීම තුළින් සියලුම අවස්ථාවන්වලදී කාන්තා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රාජ්‍ය පාර්ශවයන්ට මඟපෙන්වීම අරමුණු කරනු ලබයි. රාජ්‍ය ක්‍රියාකාරීන් විසින් සිදුකරන ලද ලිංගික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් සම්බන්ධයෙන් වගවීම ප්‍රවර්ධනය කරන අතරතුර ආරක්ෂා කිරීමට ඇති යුතුකම යටතේ වැළැක්වීම සඳහා වන නිසි සැලකිල්ල, විමර්ශනය, දඬුවම් ක්‍රියාත්මක කිරීම මගින් හා සම්මුතිය යටතේ වන කාන්තාවන්ගේ අයිතිවාසිකම් අඩු කරන තනි පුද්ගලයින්ගේ හෝ ආස්ථිත්වයන්ගේ ක්‍රියාවන් වලට ප්‍රතිකර්මයන් සහතික කිරීම තුළින් රාජ්‍ය පාර්ශවයන්ට රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් නියාමනය කිරීමද අවශ්‍ය කෙරේ. යුධ ගැටුම් තුළ ලිංගික ප්‍රචණ්ඩත්වය යන්න ගැටුමක අවසානයත් සමඟ අත්‍යවශයෙන්ම අවසන් නොවන උග්‍ර ආකාරයේ වෙනස්කොට සැලකීමක් බව සාමාන්‍ය නිර්දේශ පිළිගනු ලබයි. එහි 38 වන ඡේදය තුළ, CRSVහි හේතු සහ ප්‍රතිඵල ආමන්ත්‍රණය කිරීම අරමුණු කරගත් පහත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

අ. රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් සිදු කරන සියලුම ආකාරයේ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන් ව්‍යවස්ථා. ප්‍රතිපත්තීන් සහ සංධානයන් මගින් තහනම් කිරීම;

ආ. විශේෂයෙන්ම රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් සිදුකරන ලද සියලුම ආකාරයේ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන් වැළැක්වීම. විමර්ශනය සහ දඬුවම් කිරීම; සහ එකී ක්‍රියාවන් සම්බන්ධයෙන් ශූන්‍ය ඉවසීමක් දැරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම;

ඇ. කාන්තාවන්ගේ හා ගැහැණු දරුවන්ගේ යුක්තියට ප්‍රවේශ වීම සහතික කිරීම; ලිංගික හා ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමට ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංවේදී විමර්ශනාත්මක ක්‍රියාපටිපාටියක් යොදා ගැනීම; ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංවේදී පුහුණුවක් පවත්වාගෙනයාම හා චර්යා ධර්ම සංග්‍රහයක් සහ සාම සාධකයින්ද ඇතුළුව පොලිසිය, හමුදාව සඳහා එකඟතාවයන් යොදාගැනීම; ස්වකීය ස්වාධීනත්වය, අපක්ෂපාතිත්වය සහ ඒකාග්‍රතාවය සහතික කිරීම සඳහා සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන්හි සංදර්භය තුළ අධිකරණයේ හැකියාවන් ගොඩනැංවීම;

ඈ. ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් හා ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන්ම විවිධ සැකසුම් වලින් සහ විවිධ ඛාණ්ඩ වලට අයත් ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධයෙන් දත්ත එකතු කිරීමේ ක්‍රමයන් එක්රැස් කිරීම හා ප්‍රමිතිගත කිරීම;

ඉ. ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන්හි වින්දිතයින්ට, විශේෂයෙන්ම ලිංගික ප්‍රචණ්ඩත්වයන් වලදී පරිපූර්ණ වෛද්‍ය ප්‍රතිකාර, මානසික සෞඛ්‍ය සත්කාර සහ මනෝවිද්‍යාත්මක සහය සඳහා ප්‍රවේශය තිබෙන බව සහතික කිරීමට ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම සහ ඵලදායී ක්‍රියාමාර්ග යොදාගැනීම;

ඊ. ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්ව දිවිගලවාගත් අයට එකම වහලක් යට වෛද්‍ය, නීති සහ මනෝසමාජීය සේවා සපයන සාප්පු, ආර්ථික හා සමාජීය සවිබල ගැන්වීම් හා නැවත ඒකාබද්ධ කිරීම් සඳහා ක්ෂණික සහය සපයන බහුකාර්ය ප්‍රජා මධ්‍යස්ථාන, සහ ජංගම සායන ඇතුළුව ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ ආරක්ෂක ක්‍රියාකාරීන් සහ සේවා සපයන්නන් සම්බන්ධ කිරීමට සම්මත මෙහෙයුම් ක්‍රියාමාර්ග සහ විශේෂඥ උපදෙස් සඳහා යොමු කිරීම් සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම;

උ. ලිංගික ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සිය ප්‍රජනක සෞඛ්‍ය කෙරෙහි වන බලපෑම ද ඇතුළුව ප්‍රචණ්ඩත්වයට ලක්වන කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ විශේෂ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස තාක්ෂණික විශේෂඥතාවයන් සඳහා ආයෝජනය කිරීම සහ සම්පත් වෙන් කිරීම;

ඌ.ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට සහ HIV වලට නිවාරණය සහ ප්‍රතිචාර දැක්වීම සම්බන්ධ කරන හා ඒ සඳහා පෙළගස්වන විශේෂ මැදිහත්වීම් ජාතික ප්‍රතිචාරයන්ට ඇතුළත් බව සහතික කිරීම.

යුධ සංදර්භය තුළ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සිදු වූ සියලුම වින්දිතයින්ට යුක්තිය වෙත ප්‍රවේශ වීමට සුදුස පරිසරයක් නිර්මාණය කිරීම හා පහසුකම් සැලසීම සියලුම රාජ්‍යය පාර්ශවකරුවන් වෙත යුතුකමක් ලෙස පැවරී ඇති බව සාමාන්‍ය නිර්දේශ අංක 30 පිළිගනී. 80 වන ඡේදයේ සඳහන් නිර්දේශ අනුව, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංවේදී සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සමානාත්මතාවයෙන් යුත්; දඬුවම් නොලබා ගැලවී යාම මර්ධනය කරන සහ අපරාධමය වගවීම වැඩිදියුණු කරන; නැවත වින්දිතයින් බවට පත් කිරීම හා නැවත අපකීර්තියට පත්කරවීම වළක්වාලන නීති හා කාර්ය පටිපාටීන්ගෙන් සමන්විත ක්‍රමයක් වන සංක්‍රාන්තික යුක්තිය සඳහා පුළුල් ප්‍රවේශයක් සහතික කිරීම අවශ්‍ය කෙරේ. එය රාජ්‍ය පාර්ශවයන්ට, ඔවුන්ගේ (කාන්තාවන්ගේ) අවශ්‍යතාවයන් හා උල්ලංඝනයන්හි ස්වභාවය සැලකිල්ලට ගැනීම තුළින් නීති ආධාර සහ ඵලදායී හා කාලෝචිත පිළියම් සැපයීම මගින් කාන්තාවන්ගේ යුක්තියට ප්‍රවේශය වැඩිදියුණු කිරීමට ඉල්ලා සිටී.

## 4.2 සාමාන්‍ය නිර්දේශ අංක 33

සාමාන්‍ය නිර්දේශ අංක 33 විස්තරාත්මක ලෙස යුක්තියට ප්‍රවේශ වීම පුළුල් කරන අතර ස්වාධීන, අපක්ෂපාතී, විශ්වසනීය හා ප්‍රවේශ විය හැකි යුක්ති ක්‍රමයක් නිර්මාණය කිරීම හරහා කාන්තාවන් සවිබල ගැන්වීම අරමුණු කරගත් විවිධාකාර නිර්දේශයන් සපයයි. වෙනස්කොට සලකන නීති, ස්ත්‍රී පුරුෂභාවීය ඒකාකෘතීන්, වෙන්කිරීම් හෝ සංකීර්ණ වෙනස්කම් කිරීම්, කාර්යපටිපාටිකමය හා සාක්ෂිමය අවශ්‍යතාවයන් හා පරිචයන් සහ යුක්තියට ප්‍රවේශ වීමට ඇති සිය අයිතියට බාධා කරන ළඟාවාය නොහැකි අධිකරණමය යාන්ත්‍රණයන් වැනි බාධක වලට නිරන්තරයෙන්ම මුහුණපාන්නේ ය යන කරුණ එමගින් පිළිගැනෙයි.

සාමාන්‍ය නිර්දේශ, ස්ත්‍රී පුරුෂභාවී සමානාත්මතා යුක්ති ක්‍රමයක කොටසක් වන එකක් අනෙක හා බැඳුණු සංචරක 06 ක් හඳුනා ගනියි. ඒවා නම්, විනිශ්චය විෂය බාධා රහිත යුක්තියට ප්‍රවේශය සහ යුක්තියට ප්‍රවේශ වීම සඳහා කාන්තාවන් සවිබල ගැන්වීම උපයෝජ්‍යතාවය ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ වල අධිකරණයන්හි සහ අනෙකුත් අධිකරණමය ව්‍යුහයන්හි ළඟාවියහැකි බව දැරිය හැකි, ප්‍රවේශ විය හැකි හා කාන්තාවන්ගේ අවශ්‍යතා අනුව හැඩගැසී ඇති යුක්ති ක්‍රමයන්හි යහපත් තත්වයේ ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී හා සහභාගිත්ව රාමුවක් තුළ ඵලදායී ප්‍රතිකර්ම සපයන නිපුණත්වය, ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය යන අන්තර්ජාතික ප්‍රමිතීන් වලට අනුගත වන යුක්ති ක්‍රමයන්හි පිළියම් සැපයීම ඍදකාන්තාවන්ට හිතකර ආරක්ෂාවක් ලබා දෙන සහ අර්ථාන්විත සහන ලබා දෙන වගකිවයුතු බව යුක්ති ක්‍රමයේ ක්‍රියාකාරීත්වය නියාමනය කිරීම තුළින් යුක්තිය සඳහා වන සමාන ප්‍රවේශයන් සහ අධිකරණයේ ස්වාධීනත්වය, අපක්ෂපාතිත්වය, ඒකාග්‍රතාවය සහ විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා කමිටුව විවිධ නිර්දේශයන් සපයනු ලබයි. වෘත්තිකයින් විසින් ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී ආකාරයකට නඩු කටයුතු මෙහෙයවන යුක්ති ක්‍රමයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය සහ ඒවා යුක්ති ක්‍රමයේ නිසි ක්‍රියාකාරිත්වය සහතික කිරීම පිණිස වන අධීක්ෂණ ක්‍රමවේදයක් හරහා නියාමනය කිරීම එමගින් අවධාරණය කරයි. කාන්තාවන් සම්බන්ධයෙන් සමාන අධිකරණමය සැලකිල්ලක් සහතික කිරීම සඳහා, පාර්ශවයන් හා සාක්ෂිමය රීති, විමර්ශනයන් හා අනෙකුත් නෛතික සහ අර්ධ අධිකරණමය කාර්යපටිපාටීන් අපක්ෂපාතී හා ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ඒකාකෘතීන් හෝ පූර්ව විනිශ්චයන් වලින් බලපෑමට ලක්ව නැති බව සහතික කිරීමට සඳහා වන යාන්ත්‍රණයන්හි ක්‍රියාකාරීත්වය අතර සමානාත්මතාවය සහතික කිරීමට ඔප්පු කිරීමේ භාරය පිළිබඳ රීති සංශෝධනය කිරීම අවශ්‍ය කෙරේ.

අයිතිවාසිකම් උල්ලංඝනය වූ කාන්තාවන් අනාගතයේදීද පහසුවෙන් පීඩාවට පත්විය හැකි තත්වයකට පත්විය හැකි අතර ඒ නිසාවෙන්, රාජ්‍ය පාර්ශවකරුවන් විසින් කාන්තා පැමිණිලිකරුවන්, සාක්ෂිකරුවන්, සහ විත්තිකරුවන් නීති කටයුතු අතරතුර හා ඉන් පසුව තර්ජනයන්ගෙන්, අතවරයන්ගෙන්, ලිංගික ප්‍රචණ්ඩත්වයන්ගෙන් හා අපකීර්තියට පත්කිරීමෙන් ආරක්ෂා කිරීමට හා ඔවුන්ගේ පෞද්ගලිකත්වය, සහ/හෝ නිර්නාමිකත්වය ආරක්ෂා කිරීම පිණිස පියවර ගැනීමට අවශ්‍ය බව කමිටුව හඳුනාගනියි.

යුධ ගැටුම් තුළ ලිංගික ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ව විවිධ ආකාරයන්ගෙන් අපකීර්තියට පත් කරවන අතර ඔවුන් අත්‍යවශ්‍ය සේවාවන්ට ප්‍රවේශ වීම වළක්වාලයි. එමනිසා, යුක්තිය වෙත ප්‍රවේශ වීමට කාන්තාවක් විසින් ගත යුතු පියවර ගණනාව අවම කිරීමට නීතිමය හා සමාජ සේවා රැසක් සපයන යුක්ති ප්‍රවේශ මධ්‍යස්ථාන පිහිටුවිය යුතු යැයි කමිටුව විසින් නිර්දේශ කරයි. තවදුරටත් කමිටුව නිර්දේශ කරනුයේ, ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා බලය පැවරීම, වෙනස්කොට සැලකීමේ ව්‍යවස්ථාවන් අවලංගු කිරීම, අන්තර්ජාතික මානව හිමිකම් සම්මතයන්

සමඟ අනුගත වන ව්‍යවස්ථා සම්පාදනය කිරීම සහ යුධ ගැටුම් තුළ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් වලට අදාළ වන්දි ලබා දීමේ යාන්ත්‍රණයන් තීරණය කිරීම රාජ්‍ය පාර්ශවකරුවන් විසින් සිදු කළ යුතු බවයි.

යුක්ති ක්‍රමයේ ස්වාධීනත්වය හා කාර්යක්ෂමතාවය මෙන්ම කාන්තා අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම කෙරෙහි බලපෑමක් ඇති පරිපාලන ව්‍යුහයන් පිළිබඳ පරීක්ෂා කිරීමට හා විමර්ශනය කිරීමට ඵලදායී හා ප්‍රමාණවත් යාන්ත්‍රණයන් ස්ථාපිත කර නොමැති නම් යුක්තිය සඳහා වන ප්‍රවේශය දිගුකාලීන ලෙස තහවුරු කළ නොහැක.

ව්‍යංගයෙන් හෝ ප්‍රකාශිතවම කාන්තාවන්ට එරෙහි වෙනස්කම් ඇති කරන සහ යුක්තියට ප්‍රවේශ වීමට කාන්තාවන්ට ඇති අයිතිය භුක්ති විඳීමට බාධා ඇතිකරන නීති, කාර්යපටිපාටීන්, රෙගුලාසි, චාරිත්‍ර හා පරිචයන් අහෝසි කිරීමෙන් හැර නීතිය ඉදිරියේ සමානාත්මතාවය යන මූලධර්මයට බලාත්මකභාවයක් ලබා දිය නොහැකි බව සාමාන්‍ය නිර්දේශ අංක 33 හඳුනා ගනියි.

සමාජය තුළ නොපෙනී එහෙත් ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ඒකාකෘතීන් සහ අගතිගාමී අදහස් යුක්ති ක්‍රමයක් තුළට කාවැදීමේ හැකියාවෙන් යුතුය. වින්දිතයෙකු බවට පත්ව දිවිගලවාගත් අයෙකුව ගමේ සිල්ලර කඩයකදී අපහාසයට ලක් කරවන තැනට යම්තැනැත්තෙකුව පත්කරවිය හැකි ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ පූර්වාකල්ප හා පූර්වානුමිතීන්, අධිකරණය ඉදිරියේ යුක්තිය පතන, යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයෙකු බවට පත්ව දිවගලවාගත් තැනැත්තෙකු කෙරෙහි විනිශ්චයකාරවරයෙකු, නඩු පවරන්නෙකු හෝ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියෙකු සිතන ආකාරය සමඟ එක හා සමාන මට්ටමක පැවතිය හැකිය. ඒකාකෘතීන් සහ අගතිගාමී අදහස් කෙරෙහි අධික බලපෑමක් ඇති කරන අධ්‍යාපනය, දැනුවත් කිරීම සහ ශක්‍යතාවයන් ගොඩනැංවීම සම්බන්ධයෙන් කමිටුව ඉහළ මට්ටමේ වැදගත්කමක් දක්වන අතර රාජ්‍යන් විසින් පොදු මහජනතාව හා වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයගේ එදිනෙදා ජීවිතය කෙරෙහි බලපෑමක් ඇති විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ව දැනුවත් කිරීමට කාර්යක්ෂම පියවර ගැනීම අපේක්ෂා කරයි.

> "මෙවැනි දෑ සිදුවන විට, වින්දිතයින් අප වුවද අපව අපරාධකරුවන් ලෙස සලකනු ලබයි. අපට සිදු වූ දෑ අපරාධයන් වේ. එය අසාධාරණයි. මෙය වෙනස් විය යුතුයි. සමාජය තුළ සාමාන්‍ය ජීවිත ගත කිරීමට අපට හැකියාව තිබිය යුතුයි. අපි අපරාධකරුවන් නොවන නිසා, සමාජයේ ගරුත්වය ලැබීමට අප සුදුස්සන් වේ. සමාජයේ පවතින ආකල්ප වෙනස් විය යුතුයි."
>
> **වින්දිතයෙකු බවට පත්ව දිවිගලවාගත් අනුරාධපුරයේ සිංහල වැසියෙක්.**

## 5. යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ අපකීර්තීන් ආමන්ත්‍රණය කිරීම සඳහා අගතිගාමී අදහස් පිළිබඳ මාර්ගෝපදේශ.

> "සමාජය, සංස්කෘතිය හෝ ආගම වින්දිතයින්ට පිහිට නොවේ. ඒවා සෑම විටම කාන්තාවට දෝෂාරෝපණය කරන අතර කාන්තාවට පීඩනය ගෙනදෙයි, ඔවුන් වඩාත් පීඩාවිඳිය යුතු වේ."
>
> **වින්දිතයෙකු බවට පත්ව දිවිගලවාගත් කිලිනොච්චියේ දමිළ වැසියෙක්.**

CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය සහ ඔවුන්ගේ පවුල් වලට එරෙහි අපකීර්තිය වැඩි කරවන හේතු හා ප්‍රතිඵල ආමන්ත්‍රණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයින් සම්මුතියෙන් යුතුව ප්‍රයත්නයන් ගනු ලබන්නේ නම් එය මඟහැරවිය හැකි හැක්කකි. CRSV හා බැඳුණු අපකීර්තිය වළක්වාලීම හා ආමන්ත්‍රණය කිරීම සඳහා වන විශ්වීය ක්‍රියාමාර්ග හා සම්බන්ධ මූලධර්මයන්, අපකීර්තිය යන්න ස්ත්‍රී පුරුෂභාවීය අනන්‍යතාවය, සමාජ අස්ථායීතාවය, සංස්කෘතිය, බලය හා සමාජමය අසමානතාවයන් විසින් ස්ථිරකරනු ලැබූවක් ලෙස හඳුනාගනු ලබයි. දිවිගලවාගත් අය කේන්ද්‍ර කරගත් නිර්දේශ හා පුළුල් මාර්ගෝපදේශ, වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට, වෘත්තිකයින්ට සහ අනෙකුත් දායක පාර්ශවයන්ට CRSV හා බැඳුණු අපකීර්තිය අවසන් කිරීමට ඉඩකඩ සපයන අතර CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට ප්‍රකෘති තත්වයට පත් වීමට හා යථා තත්වයට පත් වීමට ශක්තිය ලබා දෙයි.

CRSV හි අපකීර්තිය වැළැක්වීමට හා ඊට ප්‍රතිචාර දැක්වීමට යෝජනා කර ඇති යාන්ත්‍රණයන්, එකී අපකීර්තියේ ප්‍රතිඵලයක් ලෙස වින්දිතයින්ට එරෙහිව ක්‍රියාත්මක වන අගතිගාමී අදහස් ආමන්ත්‍රණය කිරීමේදී ඉතාවැදගත් වේ.

## 5.1 නිර්දේශ

> "මා නිදාසිටින අතර මිනිසුන් 04 දෙනෙක් මගේ නිවසට පැමිණ, මගේ කලවය කෙනිත්තීම නිසා ඇති වූ රිදීමෙන් මා අවදිවීමට සැලැස්වූ විට දැනෙන්නේ කෙසේද යැයි කිසිසේත්ම මා හට විස්තර කළ නොහැකිය. මාගේ කැමැත්තක් නොමැතිව අයුක්තියක් මා හට සිදු වුවද, සමාජය සංස්කෘතිය විසින් වින්දිතයන්ට ලැබිය යුතු (ලැබීමට හිමිකම ඇති) යුක්තිය පිළිගැනීමට අපොහොසත්ය. මගේ අසල්වැසියන් මා දකිනුයේ අපකීර්තියට පත් වූ හා කැලැලකට ලක් වූ පුද්ගලයෙකු ලෙසයි."
>
> **වින්දිතයෙක් බවට පත්ව දිවි ගලවාගත් උතුරේ දමිළ වැසියෙක්**

පහත ලබාදී ඇති නිර්දේශ, CRSV හි වින්දිතයන් බවට පත්ව දිවිගලවාගත්තවුන්ගේ වැඩි සහභාගිත්වයක් සමාජය තුළ ඇති කිරීම සඳහා පහසුකම් සැපයීම අරමුණු කරගත් අයිතිවාසිකම් මත පදනම් වූ, වින්දිතයන් කේන්ද්‍රකරගත් පුළුල් ප්‍රවේශයක කොටසක් ලෙස අදාළ සියලුම පාර්ශ්වකරුවන් විසින් බලාත්මක කළ යුතුය.

1. **බහු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය:** CRSVහි වින්දිතයින් බවට පත්ව දිවිගලවා ගත්තවුන්ගේ අයිතිවාසිකම් හා ජීවිතවලට බලපාන කරුණු සම්බන්ධයෙන් විවිධ පාර්ශව කරුවන් අතර සංවාදයන් ධෛර්යමත් කිරීම සහ අගතිගාමී අදහස් මැඩපැවැත්වීමේ ආයතනික ප්‍රතිසංස්කරණ සකස් කිරීම. CRSV හි වින්දිතයන් බවට පත්ව දිවිගලවා ගත් වින්දිත්යන්ට එරෙහි ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් වෙනස්කොට සැලකීම් ආයතනික වශයෙන් පෝෂණය කරන ආකල්ප සහ නියාමයන්ට වෙනස් කිරීම්වලට ප්‍රතිචාර දක්වන පරිසරයක් නිර්මාණය කිරීම.

2. **නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයට** CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවා ගත්වුන්ට එරෙහි වෙනස්කොට සැලකීම හා අගතිගාමී අදහස් වළකාලීම පිණිස හරයාත්මක හා කාර්යපටිපාටිකමය නීති සංශෝධනය කෙරෙන බව සහතික වීම. තවදුරටත්, වින්දිත්යන් බවට පත්ව දිවිගලවාගත්තවුන් හා සම්බන්ධ නීතිය, ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික නෛතික බැඳීම් හා සමඟ එක්ව ගමන් කරන බව සහතික කිරීම. මෙම තනි පුද්ගලයින්ගේ සම්බන්ධයෙන් පවතින බිම් මට්ටමේ යථාර්ථයන් පිළිඹිබු වන විමර්ශනාත්මක හා ඇතුළත් කිරීම් අධ්‍යයනයන් මත පදනම් වෙමින් නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම.

3. **පුහුණුව හා අධ්‍යාපනය:** පුළුල් හා අර්ථාන්විත පුහුණු සහ ශක්‍යතා වර්ධන වැඩසටහන් ආරම්භ කිරීම මගින් පද්ධතිය තුළ නොපෙනී එහෙත් ක්‍රියාත්මකව පවතින අගතිගාමී අදහස් මැඩපැවැත්වීමට කටයුතු සම්පාදනය කිරීම. වින්දිතයින් බවට පත්ව දිවි ගලවාගත්තවුන්ට ප්‍රකෘති තත්වයට පත් වීමේ හෝ නැවත ඒකාබද්ධ කිරීමේ ගමන්මග පුරාවටම අවම හෝ කිසිදු අගතිගාමී තත්වයකට මුහුණ දීමට සිදු නොවන බව සහතික කිරීමට පහත හඳුනාගෙන ඇති සෑම ක්ෂේත්‍රයකම මෙවැනි ආකාරයේ දැනුවත් කිරීමක් අත්‍යාවශ්‍ය වේ.

4. **සම්පත් හා අරමුදල්:** වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය අත්දකින ලද අගතිගාමී අදහස් මැඩපැවැත්වීම අරමුණු කරගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ පාර්ශවකරුවන්ට අවශ්‍ය සම්පත් හා අරමුදල් සැපයීම.

5. **වගවීම හා අධීක්ෂණය:** පාර්ශවකරුවන් සිය වගකීම් හදවතට එකඟව සහ අපක්ෂපාතීව සිදු කිරීම පිණිස වගවීම හා විනිවිදභාවය සඳහා ස්වාධීන අධීක්ෂණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම.

6. **වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය බලගැන්වීම:** විශ්වාසනීය මූලාරම්භයන් හා සම්බන්ධ වන කාන්තාවන්ගේ ස්වාධීනත්වය හා ආර්ථික හා සාමාජීය බලය වැඩිදියුණු කිරීමට හැකියාව සහිත ක්ෂුද්‍ර මූල්‍ය, ප්‍රමිතිගත ණය වැඩසටහන් සහ අධ්‍යාපනික, වෘත්තීය පුහුණු, තාක්ෂණික, ජීවන තත්ව පුහුණු වැඩසටහන් වලට සහය දීම. CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය සමඟ වැඩකරන තනි පුද්ගලයින් සහ ආයතන වලට කෙටිකාලීන හා දිගුකාලීන සහය ලබා දීම.

7. **වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය කේන්ද්‍ර කරගත් සහයක ජාල:** වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට සිය සජීවී අත්දැකීම් බෙදාගැනීමට ඉඩක් නිර්මාණය කරන ජාතික/දේශීය ජාලයන් ධෛර්යවත් කිරීම. සමාන ඉරණමක් අත්විඳි තවත් අයද සිටින බව දනිමින් වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයෙක් ඇයට එරෙහිව ක්‍රියාත්මක වන අගතිගාමී අදහස් හා අපකීර්තිය නිරාකරණය කරගැනීමට බලගැන්විය හැකිය.

8. **වැළැක්වීම:** CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට එරෙහි වැදගත් හේතු ආමන්ත්‍රණය කිරීමට සහ සම්මුතිගත උත්සහයන් ගෙන ඇති බව සහතික කිරීම සහ එකී පහසුවෙන් පීඩාවට පත්විය හැකි අයගේ අයිතිවාසිකම් ඉදිරි ප්‍රචණ්ඩත්වයන් හා

වෙනස්කොට සැලකීම් වලින් ආරක්ෂා කිරීමට අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම.

9. **දැනුවත් කිරීම:** ප්‍රජාවන්ගේ සංයුක්ත සමාජ වගකීම පිළිබඳ පුළුල්ව පැතිරුණු සංවාදයන් ප්‍රවර්ධනය කිරීම; CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය කෙරෙහි බලපෑමක් ඇති සියලුම පාර්ශවයන් ළඟාකර ගැනීමට හැකිතාක් බොහෝ වේදිකාවන් යොදා ගනිමින් ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ඒකාකෘතීන් හා අසමානතාවයන් අභියෝගයට ලක් කිරීම.

## 5.2 අගතිගාමී අදහස් පරාජය කිරීම සඳහා ආදර්ශයක්

"මුලින් මම මාගේ ස්වාමිපුරුෂයා හා දරුවන් සමඟ සතුටින් හා සාමකාමීව ජීවත් වුනෙමි. අප අපගේ උපන් බිම් ප්‍රදේශ වලට ආපසු පැමිණීම නිසා යුද්ධයෙන්, අවතැන්වීමෙන් හා යුද්ධයේ බලපෑමෙන් පසුව පවා පරිපූර්ණත්වයේ හැඟීමක් මට දැණුනි. නැවත පදිංචි වීමෙන් පසුව හමුදාව පිළිබඳව අපි මදක් කලබලයට පත්වූවා. අප බියට පත් වූ ලෙසම, අපේ නැවත පදිංචි වීමෙන් දෙවැනි දිනයේ සිටම ඔවුන් ඔවුන්ගේ කෲරත්වය ඔප්පු කර පෙන්වූවා. එතැන් පටන් මා හට සැනසීමක් සොයාගැනීමට නොහැකි වුණා. එය මගේ ජීවිතයේ අමු අමුවේ පවතින හා සුව නොවන තුවාලයක් ලෙස පවතිනවා."

**වින්දිතයෙකු බවට පත්ව දිවිගලවාගත් උතුරේ දමිළ වැසියෙක්**

මෙම ලේඛනය තුළ දක්වා ඇති අපකීර්තිය අවබෝධ කරගැනීම සඳහා වන ආදර්ශය, ගෝලීය ක්‍රියාමාර්ග සඳහා වන මූලධර්ම: යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය හා බැඳී ඇති අපකීර්තිය වැළැක්වීම හා ආමන්ත්‍රණය කිරීම මෙම මාර්ගෝපදේශ සඳහා පදනම සකස් කරයි. මෙම මාර්ගෝපදේශ ක්‍රියාකාරී මට්ටම් 03ක මැදිහත් කිරීම් සිදු කරයි. එනම්, ව්‍යුහාත්මක මට්ටමේ, ප්‍රජා මට්ටමේ සහ අන්තර්පුද්ගල මට්ටමේ වශයෙනි. මෙම මාර්ගෝපදේශ ස්වභාවයෙන් කිසිසේත්ම විස්තරාත්මක නොවන බව, සහ CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය විසින් විවිධ ක්‍රියාකාරී මට්ටම් වලදී අත්දකින ලද අගතිගාමී අදහස් ඵලදායී ලෙස මැඩපැවැත්වීමට සරලව දක්වා ඇති මාර්ගයක් බවත් මෙහිදී හඳුනාගැනීම වැදගත් වේ.

"මුලදී, සිදුවීම සිද්ධ වන විට පොලිසිය කිසිදු ප්‍රශ්නයක් ඇති නොකරන ලදි. නමුත් ඔවුන් සාක්ෂි එකතුකිරීමට සහ අත්අඩංගුවට ගත් අය ඇප සඳහා ඉල්ලීම් කරන විට කලබල ඇති කිරීමට පටන් ගන්නා ලදි. නමුත් කාලය ගත වන විට, ඔවුන් වෛරයෙන් මා වෙත පැමිණීමට උත්සහ කළා. මා නිසා වරදකරුවන් හතර දෙනෙකු අවුරුදු තුනකට වඩා වැඩි කාලයකට හිරේට නියම වීමට ඇති බවත් මා හට මේ නිසා ලක්ෂ විස්සකටත් වඩා ලැබීමට යන බවත් දක්වා වරක් කිලිනොච්චි පොලිස් ස්ථානයට අනියුක්තව සිටි දමිළ භාෂාව දන්නා සිංහල පොලිස් නිලධාරියෙකු මට කෑ ගැසුවා. මම ප්‍රතිඋත්තර දැක්වූයේවත් ප්‍රතිචාර දැක්වූවේවත් නැහැ."

**වින්දිතයෙකු බවට පත්ව දිවිගලවාගත් උතුරේ දමිළ වැසියෙක්**

දේශපාලනික හා පරිපාලන පරිසරය, නීති හා ප්‍රතිපත්ති සම්පාදනය ක්‍රියාවලිය, සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන්, අධිකරණ හා නිති ක්‍රියාත්මක කිරීමේ කාර්යපටිපාටීන් සහ ප්‍රමිතීන්, CRSV හි වින්දිතයින් බවට පත්ව දිවි ගලවාගත් අය පිළිබඳ ක්‍රියාවලින් හා ප්‍රතිචාර දැක්වීම් තුළ වන අගතිගාමී අදහස් මැඩලීමට අන්තර්පුද්ගල මට්ටමේ මැදිහත්වීම් අරමුණු කර ගනී.

වෙනස්කොට සැලකීමේ චින්තන ධාරාව හා හර පද්ධතීන් කෙරෙහි බලපෑම් ඇති කරන සහ වෙනස් කරවන සිවිල් සංවිධාන සහ මාධ්‍ය ඇතුළුව අගතිගාමී අදහස් ඇතිකරන ජාතීභේදවාදී පරිසරයන් තුළ අත්දකින ලද අගතිගාමී අදහස් මඩපැවැත්වීම ප්‍රජා මට්ටමේ මැදිහත් වීම් අරමුණු කර ගනී.

වින්දිතයින් බවට පත්ව දිවි ගලවාගත් අයට සිය පවුලේ සාමාජිකයින්ගෙන්, මිත්‍රයින්ගේ, සේවා සපයන්නන්ගේ සහ ප්‍රජාවේ සමාජිකයින්ගේ අතින් සිදු වන කටයුතු වලින් ලද අගතිගාමී අත්දැකීම් මැඩපැවැත්වීම අන්තර්පුද්ගල මට්ටමේ මැදිහත්වීම් තුළින් අරමුණු කරගනී.

"සමාජය සිතන්නේ අපට වැරදි චරිත තිබූ බවත් අපේම වැරැද්දක් හේතුකොටගෙන අපව දූෂණයට ලක් වූ බවයි. අපිට සැලකූයේ ඉතා පහත් ලෙසයි. ලිංගික වශයෙන් ප්‍රචණ්ඩත්වයට ලක්වූවන්ව අපගේ සංස්කෘතිය විසින් අතිශය පිළිකුල් කරයි. අප මෙම සමාජයට අයත් නොවේ. අපට සංස්කෘතික උත්සව වලට සහභාගී වීමට පවා ඉඩ ලබා නොලැබේ. මා හට බොහෝමයක් මිනිසුන් අහිමි වුණා. මා ඔවුන්ගේ කීර්තිනාමය විනාශ කළ බව මාගේ නෑදෑයින් කියනවා. මගේම පවුලේ සාමාජිකයින් මා හට දුෂ්ට ලෙස සැලකූවා. ගමේ කිසිදු ගරුකටයුතු ස්ථානයකට මට යන්නට නොහැකියි. මට කිසිදු සමාජ ස්ථාවරත්වයක් තිබුණේ නැහැ. කිසිවකුට මා සමඟ කිසිවකුත් කිරීමට අවශ්‍යවූයේ නැහැ."

**වින්දිතයෙකු බවට පත්ව දිවිගලවාගත් පොලොන්නරුවේ සිංහල වැසියෙක්**

"ඔහු පළමුව මාව දූෂණය කරනු ලැබුවා. ඉන් පසුව ඔහු ඔහුගේ මිතුරාට මාව දූෂණය කරන ලෙස දැන්වූවා. ඔහු මට පයින් ගසා පහර දෙන ලැබුවා. මා සිදු කළ ලෙස කාන්තාවකට ආඩම්බර වී පුරුෂයෙකුව ප්‍රතික්ෂේප කිරීමට නොහැකි බව ඔහු ප්‍රකාශ කළා. මා එම තැනැත්තාව හොඳින්ම හඳුනනවා. එහෙත් මා කිසිවක් සිදු කළේ නැහැ. කිසිවකුටත් මේ පිළිබඳව කීමට ගියේ නැහැ. ඔහු හමුදාවේ සිටි නිසා මම පොලිසියට යාමට බය වුණා. ඔහු මා පසුපසින් හා මගේ පවුල පසුපසින් ඒවි යැයි මා කනස්සල්ලට පත් වූවා. මා යුක්තිය අයැද සිටියේ නැහැ. මම බය වුණා. මම ඔහුට සහ සමාජයට මුහුණදීම පිළිබඳව බිය වූවා."

**වින්දිතයෙකු බවට පත්ව දිවිගලවාගත් පොලොන්නරුවේ සිංහල වැසියෙක්**

මාර්ගෝපදේශයන් මගින් ඉලක්ක කරන ලද පිරිසට CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයෙකුගේ ජීවිතයට දුරවබෝධ බලපෑමක් පැවතිය හැකි පුද්ගලයින් හා ආයතන ගණනාවක් ඇතුළත් වේ (නමුත් ඊට පමණක් සීමා නොවේ) ඊට,

- පොලිසිය හා සන්නද්ධ හමුදා
- වෛද්‍ය හා සෞඛ්‍ය වෘත්තිකයින්/පිරිස්
- සාක්ෂිකරුවන් හා පළමු ප්‍රතිචාර දක්වන්නන්
- නීතිඥයින්, නඩු පවරන්නන්, විනිසුරුවරුන් හා අධිකරණ
- රාජ්‍ය ආයතන හා නිලධාරීන්
- සේවා සපයන්නන්
- පෞද්ගලික අංශ ක්‍රියාකාරීන්
- මාධ්‍ය
- සිවිල් සමාජය
- වන්දනීය ස්ථාන හා ආගමික ස්ථාන වල නායකයින්
- පවුල්/නෑදෑයින්/ CRSV හි වින්දිතයකු බවට පත්ව දිවිගලවාගත් අයෙකුගේ මිත්‍රයින්
- CRSV හි වින්දිතයකු බවට පත්ව දිවිගලවාගත් අයෙකු සමඟ බැඳුණු ඕනෑම තනිපුද්ගලයෙක් සහ සමස්ත ප්‍රජාව

## 5.3 අන්තර්ජාතික ප්‍රශස්ත පරිචයන්

යුධ ගැටුම් වලදී සිදු කරන ලද ලිංගික ප්‍රචණ්ඩත්වය සහ ඒ හා සමඟ එන අපකීර්තිය යනු පශ්චාත් යුධකාලීන සමාජයන් මගින් ඵලදායී ලෙස ගනුදෙනු කළ යුතු විශ්වීය යථාර්ථයකි. සාමය ගොඩනැංවීම හා සංහිඳියාව සඳහා වන උත්සහයන් යුක්තිය ඉටු වන බව සහතික කිරීමට ප්‍රමාණවත් පියවරයන් ගත යුතු අතර සමාජයෙන් නෙරපා හරින ලද වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය විසින් අත්දකින ලද කම්පනය හා පැහැදිලි අවමානයන් මෙම CRSV හි වින්තදිතයින් බවට පත්ව දිවිගලවාගත් අය නැවත ඒකාබද්ධ කිරීම අරමුණු කරගත් එකිනෙක බැඳුණු, ස්ත්‍රීපුරුෂභාවය හා සංවේදී හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයෙන් යුතු ආකෘතියකින් ආමන්ත්‍රණය කෙරේ. යුධෝපායක් ලෙස ලිංගික ප්‍රචණ්ඩත්වය වැඩි වශයෙන් භාවිත වීමත් සමඟ ඉතා දැඩි අනතුරු ඇඟවීමක් සිදුව තිබෙන අතර එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ, අන්තර්ජාතික අධිකරණමය යාන්ත්‍රණයන් තුළ සහ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් තුළ CRSV හි වින්තදිතයින් බවට පත්ව දිවිගලවාගත් අය විසින් අත්දකින ලද අපකීර්තිය පිළිබඳ ක්ෂේත්‍රයෙහි නව උනන්දුවක් ඇතිව තිබේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා 2017 සිය වාර්තාව තුළ ප්‍රකාශ කරනුයේ 'යුධ හෝ ත්‍රස්ථවාදය සම්බන්ධ උපායක් ලෙස යොදා ගන්නා ලිංගික ප්‍රචණ්ඩත්වයේ තර්කයට ලැජ්ජාව හා අපකීර්තිය අවශ්‍ය වේ' යන්නයි. මෙවැනි ආකාරයේ අපරාධයන්ට වින්දිතයින්ව සමාජය තුළින් බැහැර කරවීමටත්, ප්‍රජාවක් එක්ව බැඳ තබන පවුල හා ඥාතීත්වය සිඳ බිඳ දැමීමටත් හැකිබව ආක්‍රමණිකයින් වටහා ගනී.' එසේම, තරයේ ප්‍රකාශ කර සිටිනුයේ 'සදෝෂිභාවයේ අපකීර්තිය අපරාධකරුවන් සමඟ සෘජුවම රඳා පවතී' යන්නයි.

අදාළත්වය, අභියෝග හා CRSV කෙරෙහි වන ආයතනික ප්‍රතිචාරයන් හඳුනාගැනීමට සහ අණදෙන නිලධාරීන්, සේවක පිරිස්, සාම සාධක මෙහෙයුමකදී යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයේ අභියෝග යන් ආමන්ත්‍රණය කිරීමේදී හමුදාමය සංචරක වල භූමිකාව හා වගකීම සම්බන්ධයෙන් 'මෙහෙයුම් හා බලඇණි සම්බන්ධ හමුදා විශේෂඥයින් පුහුණු කිරීමට එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් දෙපාර්තමේන්තුව/එක්සත් ජාතීන්ගේ ක්ෂේත්‍ර සහයක දෙපාර්තමේන්තුව මගින් විශේෂඥ පුහුණු ද්‍රව්‍ය ක්‍රමවත්ව දක්වා තිබේ. තවදුරටත්, ත්‍රිවිධ හමුදා දයකත්වය සපයන රටවල් සඳහා වන එක්සත් ජාතීන්ගේ යුධගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශේෂ පුහුණු ද්‍රව්‍ය යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය කෙරෙහි වන සාමූහික ප්‍රතිචාරයන් වැඩිදියුණු කිරීම සඳහා උපායමාර්ගික පියවර රාශියක් සපයයි.

එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධාන, CRSV යන ක්ෂේත්‍රයෙහි පුළුල් කාර්යභාර්යක් ගෙනයන අතර බොහෝමයක් ප්‍රතිපත්තිමය ලේඛන හා ප්‍රකාශනයන් ලිංගික හා ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ලිංගික ප්‍රචණ්ඩත්වයේ සංකීර්ණ මූල හේතූන් හා ප්‍රතිඵලයන් ආමන්ත්‍රණය කරයි. 'ප්‍රායෝගික, සංස්කෘතික හා දේශපාලනික බාධකයන්: යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින්ගේ / වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත්තවුන්ගේ සහ ඔවුන්ගේ දරුවන්ගේ අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීම සඳහා වන ඉදිරි මාවතක් යන ලේඛනය, අපකීර්තියේ ප්‍රතිවිපාක ආමන්ත්‍රණය කළ හැක්කේ ආර්ථික, දේශපාලනික, සංස්කෘතික හා ආගමික බාධකයන් අවබෝධ කරගනු ලබන සංදර්භ විශේෂිත, වින්දිතයින් කේන්ද්‍ර කරගත් ප්‍රවේශයකින් පමණක් බව නැවත අවධාරණය කරයි. 'වින්දිතයින් බවට පත්ව දිවි ගලවාගත්තවුන් බොහෝමයක් විසින් අපකීර්තීන්, පළිගැනීමේ බිය සහ දේශීය ආයතනයන් පිළිබඳව විශ්වාසය නොතිබීම යනාදිය ඇතුළුව සිය අත්දැකීම් වාර්තා කිරීම වළක්වාලන සමාජමය බාධකයන් එමගින් හඳුනාග නු ලබයි. යුක්තියේ විකල්පයන්ගෙන් තමන්ට වාසියක් නොවන බවට වන බිය ද බොහෝමයක් වින්දිතයින් බවට පත්ව දිවි ගලවාගත්තවුන්ව සිය තත්වයන් වාර්තා කිරීමෙන් වළක්වාලයි. ප්‍රධාන වශයෙන්ම පහසුවෙන් ළඟා විය හැකි සේවාවන් හෝ ආරක්ෂිතව වාර්තා කිරීමට, සහය ලැබීමට සහ ගරුත්වයෙන් සැලකීම් ලැබීමට ක්‍රම නොමැති වීම හේතුවෙන් කාන්තාවන් යුධ ගැටුම් තුළ ප්‍රචණ්ඩත්වය වාර්තා නොකරන බව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1325 ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගෝලීය අධ්‍යනයනය සොයාගෙන ඇත.'

දේශිය හා අන්තර්ජාතික යන අධිකරණමය යාන්ත්‍රණයන් දෙක සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් අතර ඵලදායී සහයෝගය සඳහා වන හැකියාවන් ගවේශනය කිරීම මගින් යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විමර්ශන හා නඩුපැවරීම් වලට සහය දීම සඳහා අන්තර්ජාතික නියුරම්බර්ග් මූලධර්ම අධ්‍යනායතනය විසින් යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ නඩු පැවරීම් තුළ සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ අධිකරණමය යාන්ත්‍රණයන් අතර සහයෝගය: මාර්ගෝපදේශක මූලධර්ම හා නිර්දේශ සූත්‍රගත කර තිබේ. අපක්ෂපාතීත්වය හා ස්වාධීන්වය, අධිකරණ (සහ නඩු පවරන්නන්, අධිකරණයන්හි ස්වාධීනව කටයුතු කරන) සහ සිවිල් සමාජ ක්‍රියාකාරිකයින් අපක්ෂපාතීව හා ස්වාධීනව ක්‍රියා කිරීමට පමණක් නොව එසේ කරන බව පෙන්වීමට ක්‍රියා කිරීම අවශ්‍ය අවස්ථාවක, අපක්ෂපාතීත්වය හා ස්වාධීනත්වය යන්න සහයෝගය පිළිබඳ මූලික පොදු මූලධර්මයක් ලෙස හඳුනාගෙන තිබේ.

2016 පෙබරවාරි මාසයේදී, ජාත්‍යන්තර අපරාධ විමර්ශන ආයතනය මගින් සම්පාදනය කර ඇති පුරුෂයින් හා පිරිමි දරුවන්ට එරෙහි යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික හා ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය විමර්ශනය කිරීම සඳහා වන මාර්ගෝපදේශ, තොරතුරු එක්රැස් කරන්නනන්, සේවා සපයන්නන්, පර්යේෂකයින්, කතුවරුන් හා වාර්තා ප්‍රකාශකයින්, අධිකරණමය හා නීති බලාත්මක කිරීමේ නිලධාරීන් ආදීන් කෙරෙහි බලපෑ හැකි පෞද්ගලික හා ව්‍යුහගත අගතිගාමී අදහස් අවබෝධ කරගැනීමට, සංවේදී ප්‍රවේශයක් ඔස්සේ පුළුල් මාර්ගෝපදේශ සපයයි.

WHO මගින් සම්පාදනය කර ඇති ලිංගික ප්‍රණ්ඩත්වයේ වින්දිතයින් සඳහා වෛද්‍යනෛතිකමය රැකවරණය පිණිස වන මාර්ගෝපදේශ මගින් සේවා සැපයීම තුළ අගතිගාමී අදහස් වල භූමිකාව හඳුනා ගන්නා අතර CRSV හි වින්දිතයින්ට රැකවරණය සපයන වෛද්‍ය හා සෞඛ්‍ය වෘත්තිකයින් හට මෙන්ම සෞඛ්‍ය සේවා හා සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් භාරව සිටින ප්‍රතිපත්ති සම්පාදකයින්ට ප්‍රයෝජනවත් වන මාර්ගෝපදේශ ගණනාවක් සපයයි.

විවිධ ආස්ථිත්වයන් විසින් ලිංගික හා ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත අගතිගාමී අදහස් සහ අපකීර්තිය ආමන්ත්‍රණය කිරීමට මාර්ග යන් සහ විවිධ ක්ෂේත්‍රයන්හි යාන්ත්‍රණයන් සම්පාදනය කර ඇත.

උගන්ඩාවේ **කාන්තා විනිශ්චයකාරවරියන්ගේ ජාතික සංගමය** කාන්තාවන්ට එරෙහිවෙනස්කොට සැලකීම් හෝ ප්‍රචණ්ඩත්වයන් හා සම්බන්ධ නඩු තීන්දු ලබා දීමේදී අන්තර්ජාතික ලේඛනයන් ප්‍රයෝජනයට ගැනීමට අධිකරණ නිලධාරීන්ගේ ශක්‍යතාවන් වර්ධනය කිරීමේ නිරත වී තිබේ. අගතිගාමී අදහස් සොයා ගැනීමට සහ ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී නඩු තීන්දු ලබාදීමට අධිකරණ නිලධාරීන්ගේ ධාරිතාවය වර්ධනය කිරීමට පුහුණු ආකෘතීන්.

**ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ යුක්තිය සඳහා කාන්තාවන්ගේ මූලිකත්වය,** කාන්තාවන් සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා යුක්තිය සහතික කිරීම සඳහා මෙන්ම ICC සිය ක්‍රියාකාරීත්වයන් ඔස්සේ ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් යුක්තිය ඉදිරියට ගෙනයන බව සහතික කිරීම පිණිස උත්සහ ගැනීමට ගෝලීයව ක්‍රියාත්මක වේ. එමගින්, පුළුල් සහ ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් පැතිකඩක් තුළ ලිංගික ප්‍රචණ්ඩත්වය සංදර්භානුගත කිරීමට ICC විනිසුරුවන්ට, නඩු පවරන්නන්ට හා සේවක පිරිසට ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව සංවේදී කරවන පුහුණුවක් දිගටම පවත්වාගෙන යන අතර CRSV හි වින්දිතයින් සම්බන්ධයෙන් සලකා බැලෙන විට ස්වාධීන හා අපක්ෂපාතී තීන්දු ලබා දයි.

ඉන්දියාවේ **පාසැල් තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ව්‍යාපාරය** [GEMS] යනු දීර්ඝ කාලයක් පැවති ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ සමාජමය භූමිකාවන් සහ ඒකාකෘතීන් අභියෝගයට ලක් කිරීම මගින් ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් තරුණ වැඩිහිටියන් නියැලී කටයුතු කරන මූලිකත්වයකි.

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්වරයාගේ මධ්‍යම ඇමරිකාව සඳහා වන කලාපීය කාර්යාලය මගින් සංවර්ධනය කරන ලද **ස්ත්‍රී පුරුෂභාවය හා සම්බන්ධ කාන්තා ඝාතන (Femicide/ feminicide) පිළිබඳව විමර්ශනය කිරීම සඳහා වන ලතින් ඇමරිකානු ආදර්ශ සංධානය** දක්වනුයේ, 'පූර්ව විනිශ්චයන් හෝ ආකල්ප, චරිත ලක්ෂණ හෝ වින්දිතයින්ගේ හෝ විත්තිකරුවන්ගේ භූමිකාවන් පිළිබඳ ඒකාකෘතික නියාමයන් මගින් අධිකරණ ක්‍රියාමාර්ග බලපෑමට ලක් නොවන බවඅපක්ෂපාතීත්වය මගින් අවශ්‍ය කරන බවයි.' මේ සම්බන්ධයෙන් වන ප්‍රමිතීන් පිළිබඳ දීර්ඝ විශ්ලේෂණය, සත්‍ය නිශ්චය කරගැනීම, ලුහුබැඳයාම, හසුකරගැනීම, නඩු පැවරීම හා සිද්ධියට අදාළ සියලුම වරදකරුවන්ට, විශේෂයෙන්ම මහජන නිලධාරීන් සම්බන්ධව ඇති විට හෝ සම්බන්ධ විය හැකි විට අවසාන දඬුවම් ලබා දීම අරමුණු කරගත් බරපතල, අපක්ෂපාතී හා කාර්යක්ෂම විමර්ශනයක් පවතින සියලුම නෛතික ක්‍රියාමාර්ග යොදාගනිමින් ප්‍රමාදයකින් තොරව ආරම්භ කිරීමට, අධිකාරීන්ව බැඳ තබයි.

**කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන කාම්බෝජියානු දෙවන ක්‍රියාකාරී සැලැස්ම (2014-2018)** ප්‍රාථමික වළක්වාලීම, නෛතික රැකවරණය සහ බහු අංශයන්හි සේවා, නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම ශක්‍යතා වර්ධනය හා විමර්ශනයන් නියාමනය කිරීම සහ ඇගයීම යනාදිය කාන්තාවන්ට එරෙහිව සිදු කරන ලද ලිංගික ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමේදී අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතා අංශයන් ලෙස හඳුනා ගනී.

**ස්ත්‍රීපුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන්හිදී සමනෝසමාජීය සහය (GBV) වළක්වාලීමේ හා ප්‍රතිචාර දැක්වීමේ ව්‍යාපෘතිය** යනු UNFPA සහ මානසික සෞඛ්‍ය හා මනෝ වෛද්‍ය උපදේශනය පිළිබඳ මධ්‍යස්ථානය නේපාලය අතර හවුල්ව්‍යාපාරයකි. ඊට ප්‍රජා මනෝසමාජීය සේවකයින්ගේ ශක්‍යතා වර්ධනය කිරීම, සායනික අධීක්ෂණය සැපයීම, මනෝ සමාජීය හා මානසික සෞඛ්‍ය සේවා සහ දැඩි ලෙස පීඩිත වින්දිතයින්ට කම්පන උපදේශනයන් සැපයීම යනාදී ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

**AIDS සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා (IMAGE) ක්ෂුද්‍ර මූල්‍ය දායකත්වය සහිත මැදිහත්වීම** යනු දුප්පත්ම ගෘහයන් තුළ ජීවත් වන කාන්තාවන් ඉලක්ක කරගනු ලබන හා මූල්‍යමය සේවාවන් සමඟ සංස්කෘතික විශ්වාසයන්, AIDS වළක්වාලීම සහ ස්ත්‍රීපුරුෂභාවය පිළිබඳ නියාමයන් හා සම්බන්ධ ශක්‍යතා වර්ධන සැසි සම්බන්ධ කරන ග්‍රාමීය දකුණු අප්‍රිකාවේ වැඩසටහනකි.

## 5.4 අගතිගාමී අදහස් පිළිබඳ මාර්ගෝපදේශ

> “අප වැනි ලිංගික ප්‍රචණ්ඩත්වයන්ට ලක්වූ වින්දිතයින්ට, මෙය ආලෝකය වෙත ගෙන ඒමට හැකියාව තිබිය යුතු අතර සිදු වූ දෑ සම්බන්ධයෙන් යුක්තියට ප්‍රවේශ වීමට හැකි විය යුතුය. එසේම, මෙවැන්නක් නැවත තවත් අයෙකුට සිදු නොවීමට අප වගබලාගත යුතුය.”
>
> **වින්දිතයෙකු බවට පත්ව දිවිගලවාගත් මඩකලපුවේ පුරුෂ පාර්ශවයේ වින්දිතයෙක්**

අගතිගාමී අදහස් යන්න, වෙනත් පුද්ගලයෙකුට අවාසිදායක වන සිතුවිලි ක්‍රියාවලියක් වැඩීමට ඉඩ දීම තුළින් එක් පුද්ගලයෙකු වාසිසහගත තත්වයකට නිරායාසයෙන්ම පත්කරවන විශේෂ සිතුවිලි ක්‍රියාවලියක් තුළින් ප්‍රභවය ලබයි. අගතිගාමී අදහස් වැනි සිතුවිලි ක්‍රියාවලියක් කෙසේ මැඩපවත්වන්නේද යන්න වඩාත් මනෝමූලික, පුද්ගලබද්ධ හා බොහෝ දුරට ගම්‍ය වන්නාවූ ද බොහෝදෙනෙක් පිළිතුරක් බලාපොරොත්තු වන්නා වූද ගැටලුවක් වේ.

අගතිගාමී අදහස් යනු කාලයක් තිස්සේ මිනිසුන්ගේ මනස තුළට කාවැදී ඇති නිශ්චිත ලෝක දැක්මක ප්‍රකාශනයක් වුවත්, ස්ත්‍රී පුරුෂභාවය පදනම කරගත් පොදු අගතිගාමී අදහස් පෘතුලව ව්‍යාප්ත වීම වළක්වාලීමට, ප්‍රතිචාර දැක්වීමට සහ අභියෝග යට ලක් කිරීමට එකඟ වන ලද ප්‍රයත්නයන් ගනු ලබන්නේ නම් ඒවා මැඩපැවැත්විය හැකිය. එය, CRSVහි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට එරෙහිව එල්ලව ඇති අගතිගාමී අදහස ආමන්ත්‍රණය කිරීමට සකසා ඇති පුළුල් රාමුව තුළ කටයුතු කරන අදාළ සියලු පාර්ශවයන්ගේ සත්‍ය කැපවීම අවශ්‍ය කරන්නක් වන අතර එකී සංදර්භය තුළ පහත මාර්ගෝපදේශයන් සකස් කර ඇත.

### 1. ව්‍යුහාත්මක මට්ටමේ මැදිහත්වීම්

අ. යුධ සංදර්භය තුළ ඔවුන්ට එරෙහිව සිදු කරන ලද අපරාධ ප්‍රතික්ෂේප කිරීම වෙනුවට, ධනාත්මක දේශපාලනික කැපවීමෙන් CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට විධිමත් පිළිගැනීමක් ලබා දීම තුළින් වින්දිතභාවය හඳුනාගැනීම.

ආ. අදාළ සියලුම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් සහ අනෙකුත් දායක පාර්ශවයන්ගේ සහභාගිත්වය සහිතව CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට එරෙහි අගතිගාමී අදහස් ආමන්ත්‍රණය කිරීම පිළිබඳ පුළුල් හා බහු ආංශික ජාතික ප්‍රතිපත්තියක් හෝ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීම සහ වඩාත් ඵලදායී ක්‍රියාකාරීත්වයක් සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන කැපවීම් හඳුනාගන්නා බවට සහතික කිරීම.

ඇ. දේශපාලනය තුළ, රාජ්‍ය ආයතනයන්හි ඉහළම මට්ටම වල, අධිකරණයේ, නීති බලාත්මක කිරීම තුළ, සන්නද්ධ හමුදා වල සහ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය තුළ කාන්තාවන් හා පහසුවෙන් පීඩාවට පත් විය හැකි කණ්ඩායම් වල අවශ්‍යතාවයන් කෙරෙහි ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ සමානාත්මතාවය හා සංවේදීතාවය නැවත බලාත්මක කිරීමට කාන්තාවන්ගේ සාධාරණ නියෝජනයක්, සහතික කිරීම.

ඈ. CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට එරෙහි අගතිගාමී අදහස් ආමන්ත්‍රණය කිරීම සඳහා සම්පාදනය කර ඇති සියලුම පියවරයන් හා යාන්ත්‍රණයන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇති කිරීම පිණිස අවශ්‍ය අවස්ථාවන් වලදී අර්ථනිරූපකයින්ගේ සහ පරිවර්තකයින්ට පහසුකම් සහිතව සිංහල දමිළ හා ඉංග්‍රීසි භාෂා වලින් ක්‍රියාත්මක වන බව සහතික කිරීමට පියවර ගැනීම.

ඉ. සිදු කර ඇති ව්‍යුහාත්මක මට්ටමේ මැදිහත්වීම් රාජ්‍ය ආයතනයන් තුළ විශ්වාසය ගොඩනැගීමට සහ එකී සේවාවන් සපයන ආයතන වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට ළඟා වීමට, ඔවුන්ට එරෙහිව සිදු කරන ලද අපරාධයන් පිළිබඳව වාර්තා කිරීමට ඔවුන්ව ධෛර්යමත් කිරීමට සහ ඔවුන් විසින් හිමිකම් ලබන සේවාවන් වෙත නොමිලයේ ප්‍රවේශ වීම පිණිස ඵලදායී ලෙස ප්‍රමාණවත් වන බව සහතික කිරීම.

ඊ. පොදුවේ කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම් සහ අගතිගාමී අදහස් ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් ධෛර්යවත් කරන හරයාත්මක නීති, අධිකරණ කාර්යපටිපාටීන් සහ සම්ප්‍රදායන් සහ විශේෂයෙන් ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය, ප්‍රකෘති තත්වයට පත් කර ඇති බව සහ සාධාරණත්වය හා අපක්ෂපාතීත්වය පිළිබඳ ප්‍රමිතීන් සමඟ අනුගත වන බව සහතික කිරීම සඳහා ක්‍රමවත්ව විමර්ශනය කෙරෙන බවට සහතික කිරීම.

උ. ස්වාධීන හා ඵලදායී විමර්ශනයන්/නඩු පැවරීම්/නඩු විභාග පවත්වාගෙන යාමට සකසා ඇති අධිකරණ පද්ධතියක් නිර්මාණය කිරීම මගින් යුධගැටුම් යන සංදර්භය තුළ සිදුව ඇති ලිංගික ප්‍රචණ්ඩත්වයන්හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට විශේෂ නෛතික රැකවරණයක් සැපයීම.

ඌ. CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට අදාළ නීතිය ශ්‍රී ලංකාව විසින් පිළිගෙන

ඇති අන්තර්ජාතික නෛතික බැඳියාවන් සහ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ රාමුව සමඟ අනුකූල වන්නේද යන්න සහතික කිරීම.

එ. වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ව ආරක්ෂා කරන නීති වැඩිදියුණු කිරීම හා සම්පත් හෝ අරමුදල් යොමු කිරීම සහ/හෝ වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට කෙටිකාලීන හා දිගුකාලීන රැකවරණය, ආරකෂාව හා උපකාර සැපයීම පිණිස විශ්වාසය තැබිය හැකි මානව හිමිකම් හා සම්බන්ධ ආයතන සමඟ හවුලේ කටයුතු කිරීම.

ඒ. ක්‍රියාකාරිකයින් සමඟ යුක්තියට ප්‍රවේශ වීම ළඟා කර ගැනීම පිණිස සහය වීමට හා වඩාත් හොඳ ප්‍රතිපත්ති සම්පාදනය කළ හැකි සැබෑ දත්ත කාණ්ඩ ලබා ගැනීම සඳහා CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය සමඟ කටයුතු කරන දේශීය, ජාතික හෝ අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය කිරීම සහ/හෝ හවුලේ කටයුතු කිරීම.

ඔ. යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්ව ක්‍රියා වලට ස්වාධීන, අපක්ෂපාතී සහ ඵලදායී විමර්ශනයන් පවත්වාගෙන යාමට නීති බලාත්මක කරන හා නඩු පැවරීමේ නිලධාරීන් බැඳ තබන චර්යා ධර්මසංග්‍රහයක් සහ පුළුල් මාර්ගෝපදේශ සැපයීම.

ඕ. ලියා ඇති අදාළ ප්‍රකාශය අත්විඳි අත්දැකීම් වල නිවැරදි පිළිඹිබුවක් බවට සහතිකකිරීම පිණිස වින්දිතයින්ගේ පාපොච්චාරණයන් හා ලේඛන ප්‍රකාශන පිළිබඳව කටයුතු කරන කාන්තා හා පුරුෂ නිලධාරීන් දෙපිරිසම නිවැරදිව, වින්දිතයා වටහාගන්නා භාෂාවකින් කටයුතු කිරීමට හෝ අර්ථනිරූපකයෙකු හෝ පරිවර්තකයෙකුගේ සහය ඇතිව සිදු කිරීමට පුහුණු කර ඇද්ද යන්න සහතික කිරීම.

ක. යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්ව ක්‍රියා වලට සම්බන්ධ සිදුවීම් වල විමර්ශනයන් නියාමනය කිරීමට සහ අගතිගාමී අදහස් හා වෙනස්කොට සැලකීම් විය හැකි සිදුවීම් ආමන්ත්‍රණය කිරීමට ස්වාධීන විශ්ලේෂකයින්, උපදේශකයින්, අර්ථනිරූපකයින්, පරිවර්තකයින් සහ වෛද්‍ය /මනෝසමාජීය විශේෂඥයින්ගෙන් සමන්විත තාවකාලික හෝ ස්ථිර ඒකක සහ/හෝ කණ්ඩායම් ආයතනයන් තුළ ස්ථාපිත කිරීම

ග. යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්ව ක්‍රියා වලට සම්බන්ධ තොරතුරු හා සාක්ෂි එකතු කිරීමේ කාර්යය සඳහා පූර්ව ගැඹුරු පර්යේෂණ හා විශ්ලේෂණයන් සිදු කිරීම තුළින් විමර්ශන ක්‍රියාවලියට සහය වන පර්යේෂණ නිලධාරීන් ලෙස නිපුණ පුද්ගලයින් බඳවා ගැනීම සහ පුහුණු කිරීම.

ච. නිසි විමර්ශනයන් පැවැත්වීම අරමුණු කරගත් හොඳින් සම්බන්ධීකරණය කළ හා ඵලදායී වැඩසටහන් ඔස්සේ දැනුවත්කිරීම් සිදු කිරීමට, පුහුණු වලට සහ කාර්ය මණ්ඩලයන්හි ශක්‍යතා වර්ධනයට ආයෝජනයන් සිදු කිරීම. මෙම වැඩසටහන් විවිධ ආකාරයන්ගෙන් දැනුවත්භාවය ඇති කළ යුතුය. යුධගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්ව ක්‍රියා වලට අදාළ හරයාත්මක, කාර්යපටිපාටික, සාක්ෂිමය නීති හා නෛතික මූලධර්ම පිළිබඳව හා වෙනස්කොට නොසැලකීම, ස්වභාවික යුක්තිය, වින්දිතයින්ට සමාන හා ගරුත්වයෙන් යුතුව සැලකීම, රහස්‍යභාවය ආරක්ෂා කිරීම, වින්දිතයෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේදී වැදගත් වන ආකල්ප හා චරිතය යනාදී රීති පිළබඳව පුළුල් අවබෝධයක් මෙම වැඩසටහන් තුළින් සැපයිය යුතුය. ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංවේදීභාවය ඇති කිරීම සඳහා වන පුහුණු, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ඒකාකෘතීන් අභියෝග යට ලක් කළ යුතු අතර යුධ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන්හි පරාසය, හේතූන්, විවිධ ස්වභාවය සහ ප්‍රතිඵල මෙන්ම ලැජ්ජාව පිළිබඳ හැඟීම් ඇතුළත් කරගන්නා අපකීර්තිකරණයේ බලපෑම් ආමන්ත්‍රණය කළ යුතුය. නිලධාරීන් හොඳින් පුහුණු කළ යුතු අතර වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය/සාක්ෂිකරුවන්ට සිය අත්දැකීම් අනාවරණය කිරීම වඩාත් පහසු කරවීමට සූදානම්ව සිටිය යුතුය. එමෙන්ම ඔවුන් සම්බන්ධ විමර්ශනයන් වලදී රජයෙන්, ප්‍රජාවගෙන් හෝ අනෙකුත් පාර්ශවයන්ගෙන් විරෝධතාවයක් හෝ අවහිරයක් එල්ල විය හැකි අවස්ථා හැසිරවීමට පුහුණු කළ යුතුය.

ජ. ලිංගික ප්‍රචණ්ඩත්වයන් කිරීමට හෝ කිරීමට තැත් කිරීමට වගකිවයුතු හෝ CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට එරෙහිව අගතිගාමී අදහස් සහ වෙනස්කොට සැලකීම් වල ඉතා සුළු මුහුණුවරක් හෝ දැකගත හැකි ඕනෑම ස්ථාවරයක් ගන්නා නිලධාරීන් නතර කිරීමට යාන්ත්‍රණයන් හා ආයතනයන් සකස් කිරීම.

ට. විනිසුරුවරුන්, අභිචෝදකයින්, නීතිඥයින්, නඩු පවරන්නන්, ජූරි සභිකයින් සහ අධිකරණ නිලධාරීන් පාලනය කරන චර්යා ධර්ම සංග්‍රහයක් හා ආචාර ධර්ම සැකසීම; පොදුවේ කාන්තාවන්ට එරෙහි සහ විශේෂයෙන්ම CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට එරෙහි අධිකරණමය අගතිගාමී අදහස් මැඩලීමට දැනුවත් කිරීමේ හා ශක්‍යතා වර්ධනය කිරීමේ වැඩසටහන් වලට ආයොජනය කිරීම; සහ අගතිගාමී අදහස් සම්බන්ධ සිදුවීම් ආමන්ත්‍රණය කිරීමට වගවීමේ යාන්ත්‍රණන් ඇති කිරීම.

ඩ. අදාළ සියලුම පාර්ශවකරුවන් CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය සම්බන්ධයෙන් අගතිගාමී අදහස් සහ වෙනස්කොට සැලකීම් වලින් තොරව සිය

කාර්යන් සිදු කරන බව සහතික කිරීම සඳහා දේශීය සහ අන්තර්ජාතික සම්පත්දායකයින්ගේ සහභාගිත්වය ඇතිව, ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති රාමුව යටතේ නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

## 2. ප්‍රජා මට්ටමේ මැදිහත්වීම්

අ. පොදුවේ ලිංගික ප්‍රචණ්ඩත්වය හා විශේෂයෙන් CRSV සම්බන්ධ සිදුවීම් වාර්තාකරණයේදී ආචාරධර්මානුකූලව හා වගකිවයුතු ලෙස සිදු කිරීමට ප්‍රධාන ධාරාවේ මාධ්‍ය බැඳ තබන පුළුල් මාර්ගෝපදේශ සහ සංධානයන් හඳුන්වා දීම. ඇතිව තිබෙන තත්වයන් හා CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයගේ අයිතීන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට හා සංවේදී කරවීමට SGBV උද්වේගවත් කිරීම හා සාමාන්‍යකරණය කිරීම වැළකීමටත වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයගේ ජීවිත තවත් අන්තරායන්ට පැමිණවිය හැකි ප්‍රසිද්ධ ස්ථාපනයන්, සිත්ගන්නා වැකි, ඡායාරූප සහ දීර්ඝ පෞද්ගලික තොරතුරු කැමැත්ත සහිතව හෝ රහිතව යොදා ගැනීමෙන් වැළකීමටත් උපකාර ලැබීමට හා සහන සැලසීමට හැකි මාර්ග පිළිබඳව තොරතුරු සැපයීමට මාධ්‍ය වාර්තාවන් අවස්ථාව ලබා ගන්නා බව මෙම මාර්ගෝපදේශයන් සහතික කළ යුතුය.

ආ. කාන්තාවන් අපකීර්තියට පමුණුවන්නාවූ අවසානයේදී බරපතල ලිංගික අපරාධ වලට ගමන් කරවිය හැකි එදිනෙදා ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් වෙනස්කම් සහ හිරිහැර කිරීම් ආදිය ආමන්ත්‍රණය කිරීමට සමාජ මාධ්‍ය වේදිකාවන් වල වැඩි පිරිසක් යොදා ගැනීම හා ධෛර්යවත් කිරීම.

ඇ. දැනුවත් කිරීමේ වැඩසටහන් කරගෙන යාමට, ගුවන් වාර්තාකරණ, මාධ්‍ය ආයතන හරහා ප්‍රචාරය කිරීම/විචාරණය කිරීමට මූලාරම්භයන්ට සහය ලබා දීම හා CRSV පිළිබඳව, තනි පුද්ගලයින්ට සහ පවුල් ඒකකයන්ට එහි පවතින බලපෑම පිළිබඳව මෙන්ම අපරාධකරුවන්ගේ ක්‍රියාවන් අනුමත කිරීම වෙනුවට ඔවුන්ට සහය දීමට ප්‍රජාවට පවතින වගකීම පිළිබඳව පොදු මහජනතාව දැනුවත් කිරීම.

ඈ. CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය සම්බන්ධයෙන් කටයුතු කරන තනි පුද්ගලයින් සහ සිවිල් සමාජ සංවිධාන වලට දක්ෂ හා යෝග්‍ය සහය සපයන බව සහතික කිරීම සහ තවත් කිසිදු හානියක් සිදු වීම වැළැක්වීම පිණිස වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය සමඟ අන්තර්ක්‍රියාවන් වලදී වෘත්තීමයභාවය පවත්වාගෙන යාම.

ඉ. CRSV හි භයානක තත්වය පිළිබඳව සහ CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට පාසැල්, විශ්ව විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන වල, වැඩ කරන ස්ථාන වල ආදියේ ළමයින්, තරුණයින් හා වැඩිහිටියන් සංවේදී කරවීමට හා දැනුවත් කිරීමට සහ CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට හෝ ඔවුන්ගේ ආදරණීයයන්ට සමාජය සමඟ නැවත ඒකාග්‍ර වීමට සංයුක්ත පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම පිළිබඳව අවශ්‍ය සියලු පියවර ගැනීම.

ඊ. පොදු මහජනතාව CRSV හා සම්බන්ධ කරුණු පිළිබඳව දැනුවත් කිරීම අරමුණු කරගනිමින් අදාළ රේඛීය අමාත්‍යංශ, රජයේ ආයතන, පළාත් මට්ටමේ ආයතන, පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී වසම් හරහා අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම. වින්දිතයින්ට විවිධ අරමුණු සඳහා සම්බන්ධ වීමට සිදුවන නිලධාරීන්ව පුහුණු කිරීමට හා ශක්‍යතා වර්ධනය කිරීමට ආයෝජනය කිරීම.

උ. CRSV පිළිබඳ සිදුවීම් වාර්තා කිරීමට සහ තනිපුද්ගලයින් වෙනස්කොට සැලකීමට ලක්වූ අවස්ථාවන් පිළිබඳව වාර්තා කිරීමට නෛතික සහන ලබා ගැනීමට පවතින ප්‍රවේශ මාර්ගයන් සම්බන්ධව ඔවුන්ව දැනුවත් කිරීම පිණිස, මහජනතාවගේ, විශේෂයෙන්ම CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයගේ නෛතික සාක්ෂරතාවය වැඩිදියුණු කිරීමට මුල පිරිම් වලට සහය ලබා දීම.

ඌ. ලිංගයන් අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම පිළිබඳව ආගමික නායකයින්ගේ සහභාගීත්වය ඇතිව අන්තර් විශ්වාසයන් පිළිබඳ සංවාද ආරම්භ කිරීම හා ධෛර්යවත් කිරීම. CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය සඳහා ආරක්ෂිත පරිපූර්ණ ස්ථානයක් නිර්මාණය කිරීම සඳහා ආගමික නායකයින්ට ඔවුන්ගේ වේදිකාවන් චින්තන ක්‍රියාවලින් බලපෑම් කිරීම පිණිස ධනාත්මකව භාවිතා කිරීමට සහ ආගමික පතපොත අර්ථ නිරූපණයේදී අයිතිවාසිකම් පදනම් වූ ප්‍රවේශයක් පදනම් කර ගනිමින් වෙනස්කොට සැලකීමේ පරිචයන් හා හර පද්ධතීන් අභියෝගයට ලක් කිරීමට ධෛර්යමත් කිරීම.

## 3. අන්තර්පුද්ගල මට්ටමේ මැදිහත්වීම්

අ. අමාත්‍යංශ හා පළාත් පාලන ව්‍යුහයන් CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය පිළිබඳ සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේදැයි සහතික කිරීම හා ඔවුන් හිමිකම් දරන සියලු සේවාවන් වලට ආරක්ෂිත ප්‍රවේශයක් සහතික කිරීම.

ආ. CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට අත්‍යවශ්‍ය සේවා සපයන අමාත්‍යංශ, ඒවා කිසිදු පක්ෂපාතිත්වයකින් තොරව බෙදා හැරීමේ සේවා වලට කාර්ය කාර්ය මණ්ඩලය පුහුණු කර ඇති බවට සහතික කළ යුතු අතර උපදේශන ලබා දීමට, අධීක්ෂණය කිරීමට හා ක්‍රමවත්ව ප්‍රශස්ත පරිචයන් විමර්ශනය කිරීමට යාන්ත්‍රණයන් සැකසිය යුතුය.

ඇ. CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට ඔවුන්ට අවශ්‍ය කරන සේවාවන් සැපයීම සඳහා විශේෂ සහය, පරිත්‍යාග, අරමුදල් ආදිය ලැබීමට සිවිල් සංවිධාන, කැමැත්තක් දක්වන විදේශීය රාජ්‍යයන් හා අනෙකුත් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් ධෛර්යවත් කිරීම සහ/හෝ ඔවුන් සමඟ හවුල්කාරිත්වයක් ඇති කර ගැනීම.

ඈ. වින්දිතයින්ට/ දිවිගලවාගත් අයට ඔවුන්ගේ පුවත් බෙදා ගැනීම සඳහා නොමිලේ ක්‍රියාත්මක වන ජාතික උපකාරක සේවාවක් ස්ථාපනය කිරීම.

ඉ. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා මානසික සෞඛ්‍ය පිළිබඳ ධනාත්මක සංවාදයක් නිර්මාණය කිරීම. CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට මනෝවිද්‍යාත්මක කම්පනයන් සහ මානසික සෞඛ්‍ය ගැටලු මැඩපැවැත්වීමට චිත්තවේගාත්මක හා මනෝසමාජීය සහය සැපයෙන බව සහතික කිරීම.

ඊ. සෞඛ්‍ය සේවාවන් ප්‍රවේශ විය හැකි හා කාර්යක්ෂම මෙන්ම පෞද්ගලිකත්වය ආරක්ෂා කරන ඒවා බවට පත් කිරීමට; විමර්ශකයින් හා අනෙකුත් සේවා සපයන්න් සමඟ කටයුතු කිරීමේදී රහසිගතභාවය හා වෘත්තීමයභාවය පිළිබඳ මට්ටමක් පවත්වාගෙන යාමට; ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංවේදීතාවය ඇති කිරීමට හා ඕනෑම ආකාරයක වෙනස්කොට සැලකීම් වළක්වාලීමට; අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පවත්වාගෙන යාමට හා වාර්තා භාර දීමට වගකීම ඇති අය විසින් වෙන කිසිවක් නොව සතය ප්‍රකාශ කිරීම තුළින් වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අයට යුක්තිය ඉටු කරන බව සහතික කිරීමටට මාර්ගෝපදේශ පිළිබඳ පුළුල් රාමුවක් හෝ රෝහල් හා සායන වලදී ප්‍රතිකාර ලැබෙන අතරතුර වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් අය නැවත අපකීර්තිකරණයට ලක් නොවූ බව සහතික කිරීම සඳහා වෛද්‍ය වෘත්තිකයින්/කාර්ය මණ්ඩලය බැඳ තබන ආචාර්ය ධර්ම සංග්‍රහයක් සැපයීම.

උ. ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, පළාත් පාලන ආයතන නියෝජිතයින් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය වැනි මහජන නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ඒකාකෘතීන් හා වෙනස්කොට සැලකීම අභියෝගයට ලක් කිරීම අරමුණු කරගත් ශක්‍යතා වර්ධන වැඩසටහන් ආරම්භ කිරීම හා ඒවාට ආයෝජනය කිරීම.

ඌ. විශේෂයෙන්ම CRSV හි වින්දිතයින් බවට පත්ව දිවිගලවාගත් තැනැත්තන් බහුලව පැතුරුණු ප්‍රදේශ වල දැනුවත්භාවය ඇති කිරීම හා මහජනතාව දැනුවත් කිරීම. ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අගතිගාමී අදහස් හා යුධ සංදර්භය තුළ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වූ කාන්තාවන් පිළිබඳ අපකීර්තිකරණය අභියෝගයට ලක් කිරීම.

**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**
325 ඒ 1, තිඹිරිගස්යාය, කොළඹ 05
දුරකථන/ෆැක්ස් : +94 11 2055404, +94 11 2501457
විද්‍යුත් තැපෑල : srilanka.cej@gmail.com

වෙබ් අඩවිය : www.cejsrilanka.org

https://www.facebook.com/Centre-for-Equality-and-Justice
https://twitter.com/CEJ_SriLanka
https://www.instagram.com/cej_srilanka/